# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/7 - 2020 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2020.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් පහත උපලේඛනයෙන් දක්වා ඇති නිශ්චිත කාර්යයන් අධීක්ෂණය මාගේ එකඟතාවය සහිතව ඉටු කිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව වරාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මැතිතුමා වෙත පවරන බවත් එසේම මෙම විෂය පථයට ගැනෙන සියලු කාර්යයන් සම්බන්ධයෙන් සොයාබැලීම්, මැදිහත්වීමේ හා සම්බන්ධිකරණය කිරීමේ අවස්ථාව තවදුරටත් රාජ්‍ය අමාත්‍යවරයාට ඇති බවත් ප්‍රකාශයට පත් කරමි.

ජොන්ස්ටන් ප්‍රනාන්දු,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2020 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ 01,
වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

**වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. වාණිජ වරායන් සංවර්ධනය හා කළමනාකරණය කිරීම. | | |
| 2. වරායන් ආශ්‍රිත සංචාරක සේවා කටයුතු දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | | |
| 3. වරාය ආශ්‍රිතව ආදායම් උත්පාදනය හා ප්‍රවර්ධනය සඳහා නව ක්‍රමෝපායන් සකස් කිරීම. | | |

02 - 27

1A - G 31836 — 370 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*